15 MAY 2019
HIGH COURT KALUTARA

# කළුතර අධිකරණ කලාපයේ මහාධිකරණය.

නීතිපතිගේ අංකය ඒපී/ටී/12/2003

මහාධිකරණයේ අපරාධ නඩු අංකය එච්.සී. 276/03

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

## විරුද්ධව

01.සේනක අබේසේන සමරසිංහ.

..................

02.



( මහාධිකරණ විනිසුරු එච්.ඩී.ජේ. පෙරේරා මැතිතුමා ඉදිරිපිට දී

සෝමා පෙරේරා විසින් සටහන් කර ගන්නා ලදී)

15 MAY 2019
HIGH COURT KALUTARA

මහාධිකරණය - කලුතර

නඩු අංකය: එච්.සී. 276/03 2006.08.22

:- ති න් දු ව :-

ශ්‍රී ලංකා ජන රජය

-එරෙහිව-

1.සේනක අබේසිංහ සමරසිංහ.

- විත්තිකරු -

නීතිපති තුමා විසින් විත්තිකරුට විරුද්ධව මෙම නඩුව පවරා ඇත්තේ 2001 ක් වූ සැප්තැම්බර් 14 වෙනි දින හෝ ඊට ආසන්න දිනයකදී මෙම අධිකරණයේ අධිකරණ බල සීමාව තුල පිහිටි අගලවත්ත දී නීති විරෝධී මත්පැන් ලග තබා ගැනීමට සම්බන්ධයෙන් සැකපිට අත්අඩංගුවට ගන්නා ලද හේනගේ රංජනී රූපිකා නමැති අය විසින්

15 MAY 2019
HIGH COURT KALUTARA



කරන ලදැයි සැකකරන ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් තොරතුරක් ලබා ගැනීම සඳහා වද දුන් බැවින් 1994 අංක 22 දරණ වද දීම සහ අනෙකුත් කෲර අමානුෂික හෝ නින්දිත සැලකීමට හෝ දඩුවම් වලට එරෙහිව වූ පසුව සම්මත පනත වන 2 (4 ) වගන්තිය යටතේ වරදක් සිදු කල බවය.

මෙම නඩුවේ පැමිණිල්ල වෙනුවෙන් හේවගේ රංජනී රූපිකා, බෝතලාගේ ඩොල්පින් නෝනා, වෛද්‍ය ධම්මික බණ්ඩාර හේරත්, වෛද්‍ය කේ. සුනිල් කුමාර සහකාර පොලිස් අධිකාරි පද්මසිරි මුණසිංහ යන අයවලුන් සාක්ෂියට කැඳවා ඇති අතර විත්තිකරු සාක්ෂි කූඩුවේ සිට සාක්ෂි දී ඇති අතර විත්තිය වෙනුවෙන් ( එම්.ඕ.එච්.) සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි දීපාල් යසසිරි ප්‍රනාන්දු, වෛද්‍ය දනන්ගා නාමලී, මහජන සෞඛ්‍ය හෙද පුංචි කුමාරිහාමි, පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිණී වයලට් සෝමලතා යන අයවලුන් සාක්ෂි දී ඇත. එම විත්තියේ නඩුව අවසන් වීමෙන් අනතුරුව උගත් රජයේ අධි නීතීඥ මහතා අධිකරණය අමතා දේශනයක් ඉදිරිපත් කර ඇති අතර විත්තිය වෙනුවෙන් විත්තියේ උගත් නීතීඥ මිය ලිඛිතව කරුණු ඉදිරිපත් කර ඇති අතර, අතෘප්තියට පත් පාර්ශවය වෙනුවෙන් පෙනී සිටි නීතීඥ මහත්මිය ද ලිඛිතව කරුණු ඉදිරිපත් කර ඇත. මෙම නඩුවේ අතෘප්තියට පත් පාර්ශවය වෙනුවෙන් ලිඛිත දේශන ඉදිරිපත් කරනු ලැබුවේ විත්තියේ උගත් නීතීඥ මිය

04.



15 MAY 2019
HIGH COURT KALUTARA

විසින් විත්තිකරු වෙනුවෙන් ලිඛිත දේශන ඉදිරිපත් කිරීමෙන් අනතුරුවය. විත්තියේ උගත් නීතීඥ මිය විසින් විත්තියේ ලිඛිත දේශණ අධිකරණයට බාර දීමෙන් අනතුරුව අතෑප්තියට පත් පාර්ශවය වෙනුවෙන් ලිඛිත දේශණ ඉදිරිපත් කිරීමට නොහැකි බවත් ඒ අනුව එම ලිඛිත දේශන බාර ගැනීම සම්බන්ධයෙන් විරෝධතා දක්වා සිටින බවත් දන්වා ඇත. තවදුරටත් දන්වා සිටින්නේ අතෑප්තියට පත් පාර්ශවය විසින් ඉදිරිපත් කල ලිඛිත දේශනයේ විත්තියේ නීතීඥ මිය අධිකරණයට ඉදිරිපත් කල දේශණයේ අඩංගු කරුණු වලට පිළිතුරු දී ඇති බවයි. අධිකරණයේ සාමාන්‍ය ක්‍රියා පටිපාටිය අනුව නඩුව අවසන් වීමෙන් අනතුරුව පැමිණිල්ල විසින් දේශනයක් ඉදිරිපත් කලයුතු බවත්, අවසාන දේශනය ඉදිරිපත් කල යුත්තේ විත්තියෙන් බවත් උගත් නීතීඥ මිය වැඩිදුරටත් පවසා ඇත. මෙම නඩුවේ අතෑප්තියට පත් පාර්ශවය වෙනුවෙන් ලිඛිත දේශන ඉදිරිපත් කිරීමට පූර්වගාමී මහාධිකරණ විනිසුරුතුමා විසින් අවසර දී ඇති අතර එම ලිඛිත දේශන කුමන අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු ද යන්න පිළිබඳ නියෝගයක් කර නැත. අතෑප්තියට පත් පාර්ශවය වෙනුවෙන් ලිඛිත දේශන ඉදිරිපත් කිරීමට අයිතියක් ඇත. නමුත් එය ඉදිරිපත් කල යුතුව ඇත්තේ විත්තියේ දේශන ඉදිරිපත් කිරීමට ප්‍රථමයෙන් බව මගේ නිගමනයයි. ඒ අනුව මෙම නඩුවේ අතෑප්තියට පත් පාර්ශවය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද ලිඛිත දේශන සැලකිල්ලට භාජනය

15 NOV 2019

කර ගැනීමේ දී විත්තියේ උගත් නීතිඥ මිය විසින් ඉදිරිපත් කරන ලද ලිඛිත දේශනයේ සඳහන් කරුණුවලට පිළිතුරු දී ඇති කොටසට අධිකරණයේ අවධානයට ලක් නොකරමි. මෙම සිද්ධියට අදාල නීතිමය සහ සාක්ෂි සම්බන්ධයෙන් අතෘප්තියට පත් පාර්ශවය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද කරුණු පිළිබඳ පමණක් අධිකරණයේ සැලකිල්ල යොමු කරමි.

මෙම නඩුවේ පැමිණිල්ලේ ස්ථාවරය වී ඇත්තේ මෙම නඩුවේ විත්තිකරු විසින් හේවගේ රංජනී රූපිකා නමැත්තිය නීති විරෝධී මත්පැන් ලඟ තබා ගැනීමේ වරදක් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන ඇයගේ ස්වාමි පුරුෂයා පිළිබඳව අසා, ස්වාමියා සිටින තැන විමසා ඇයට පහර දීමක් සිදු කර ඇති බවයි. විත්තිය එම කරුණ ප්‍රතික්ෂේප කර ඇති අතර විත්තිකරු පවසා ඇත්තේ ඔහු එවැනි පහර දීමක් සිදු නොකල බවය. මෙම නඩුවේ පැමිණිල්ල වෙනුවෙන් ප්‍රථමයෙන් සාක්ෂියට කැඳවනු ලැබුවේ හේවගේ රංජනී රූපිකා නමැත්තිය මෙම සිද්ධියට සම්බන්ධ පහර දීමට ලක් වුවා යැයි කියන තැනැත්තියයි. මෙම රංජනී රූපිකා සාක්ෂි දෙමින් කියා සිටියේ විත්තිකරු විසින් බොරු චෝදනාවක් මත එනම් නීති විරෝධී මත්පැන් තබා ගන්නා ලදැයි පවසා 2001.09.14 දින ඇයව සවස 4 ට පමණ අත්අඩංගුවට ගත් බවත්, එදින ඇය ඇගේ දරුවා සමග නැමට ගොස් ආපසු

1 5 MAY 2019
HIGH COURT KALUTARA

අවස්ථාවේ දී බාහිර තුවාල කිසිවක් නිරීක්ෂණය නොකල බවත් තුවාල කිසිවක් තියෙනවා ඇය නොදුටු බවත්ය.

තවද මෙම නඩුවේ පැමිණිල්ල වෙනුවෙන් කැඳවූ වෛද්‍ය ධම්මික බණ්ඩාර හේරත්, මහතා සාක්ෂි දෙමින් ඔහු මෙම නඩුවේ 1 වන සාක්ෂිකාරියව 2001.09.22 වෙනි දින පරීක්ෂා කර බැලූ බවත් එම අවස්ථාවේ දී ඇය පොලිස් පරීක්ෂක සමරසිංහ විසින් ඇයගේ පිට කොන්දට යටි බඩට පහර දුන් බවට ප්‍රකාශ කල බවත් ඒ අනුව ඔහු ඇයව බාහිර වශයෙන් පරීක්ෂා කර බැලූ නමුත් ඇයගේ ශරීරයේ බාහිර තුවාල කිසිවයක් දක්නට නොතිබූ බවටත් සාක්ෂි දී ඇත. නමුත් ඇගේ යෝනි මාර්ගයෙන් එම අවස්ථාවේ දී ලේ ගලමින් තිබුන බවටත් මෙම සාක්ෂිකරු සාක්ෂි දෙමින් කියා ඇති අතර ඔහු විසින් ඉදිරිපත් කර ඇති අතර අධිකරණ වෛද්‍ය වාර්ථාව පැමිණිල්ල විසින් පැ.2 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇත. තවද, පැමිණිල්ල විසින් පිඹුර රෝහලෙන් නිකුත් කරන ලද ඇඳ ඉහ පත පැ.3 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇත. එකී පැ.3 දරණ ඇඳ ඉහ පත පරීක්ෂා කර බැලීමේ දී පෙනී යන්නේ ඇය රෝහලට ඇතුලත් වී ඇත්තේ 2001.09.15 වෙනි දින ප.ව.5.20 ට බවය. නමුත් මෙම 1 වන සාක්ෂිකාරියගේ සාක්ෂි අනුව ඇය පොලීසියෙන්

15 MAY 2019
HIGH COURT KALUTARA



ඇප මත මුදා හැර ඇත්තේ එදින ප.ව. 3ටය. ඒ අනුව ප.ව.3 සිට 5.20 දක්වා ගත වූ කාලය තුල ඇය විසින් කරන ලද ක්‍රියාවන් සම්බන්ධයෙන් සාක්ෂි කිසිවක් මෙම නඩුවේ ඉදිරිපත් වී නැත. මෙම නඩුවේ වෛද්‍ය ධම්මික බණ්ඩාර මහතාගේ මූලික සාක්ෂි යේ දී මෙවැනි පහර දීමකදී බොහෝ විට තුවාල බලාපොරොත්තු විය හැකි වුවද මෙම 1 වන සාක්ෂිකාරියගේ ශරීරයේ තුවාල නොතිබුන බව කියා ඇත. තවද, මෙම 1 වන සාක්ෂිකාරිය සාක්ෂි දෙමින් මෙම විත්තිකරු ඇයව කීප වතාවක් තල්ලු කල බවත් ඒ අනුව ඇය කීප වරක් බිම වැටී ඇති බව කියා ඇත. නමුත් වෛද්‍යවරයාගේ සාක්ෂි අනුව එසේ වුවේ නම් අවම වශයෙන් සීරීම් තුවාල හෝ මෙම 1 වන සාක්ෂිකාරියට සිදු විය යුතුව ඇති අතර වෛද්‍ය සාක්ෂි අනුව එවැනි කිසිම බාහිර තුවාල කිසිවක් දක්නට නොතිබීමේ හේතුව අනුව1 වන සාක්ෂිකාරියගේ සාක්ෂි වෛද්‍ය සාක්ෂිවලින් සනාථ වී නැත.

මෙම නඩුවේ විත්තියේ ස්ථාවරය වී ඇත්තේ 1 වන සාක්ෂිකාරියට මීට ප්‍රථම ද ඇගේ යෝනි මාර්ගයෙන් ලේ ගැලීම් සිදු වී ඇති බවත් මෙදින ද යම් ලේ ගැලීමක් වී ඇත්තේ නම් ඒ පහර දීමක් නිසා නොව ඇය විසින් ඇයට දෙන ලද වෛද්‍ය උපදෙස් පිලිනොපැද සිටීමේ හේතුව මත බවය. එය සනාථ කිරීම සඳහා විත්තිය විසින් 1 වන සාක්ෂිකාරියට මෙම

සිද්ධියට ප්‍රථමත් ලේ ගැලීම් සිදු වී ඇති බව සනාථ කිරීම සඳහා වෛද්‍ය යසසිරි මහතා සාක්ෂියට කැඳවා ඇත. ඔහු කියා සිටියේ 2001.8.9 වෙනි දින ඔහු වියන්ගල්ල ළමා/ මාතෘ සායනයේ සේවය කර තිබුන බවත් මෙම නඩුවේ 1 වන සාක්ෂිකාරිය වන රංජනී රූපිකා යන අයට අදාල මවගේ සටහන නමැති කාඩ් පතේ මුල් පිටපත විත්තිය වී.7 ලෙස ඉදිරිපත් කරන අතර ඒ අනුව මෙම 1 වන සාක්ෂිකාරියට පෙර ප්‍රසව යෝනි රුධිර වහනය සිදුවී ඇති බවට සටහන් වී ඇති බවට ද පිලිගත හැකි බවය. තවද, ඇයට අදාල ගර්භනී සටහන් පොත විත්තිය විසින් වී.5 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇති අතර වී.5 හි පෙර ප්‍රසව යෝනි රුධිර වහනය යන ඉදිරියෙන් ඇති කොටුව කපා හැර ඇති බවත්, එම කොටුව හරි යන්න සඳහන් විය යුතු බවත් මෙම සාක්ෂිකරු කියා සිටින අතර එම කපා ඉවත් කරන ලද කොටස විත්තිය 5 වී 2 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇත. මෙම වී.5 දරණ ලේඛණය 1 වන සාක්ෂිකාරිය විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන ලද ලේඛණයේ සහතික පිටපතකි. එම වී.5 දරණ ලේඛණයේ 2001.7.28 දිනද, මෙම 1 වන සාක්ෂිකාරියට රුධිර වහනයක් වී ඇති බවට සටහන් වී ඇති අතර, එය දින 4 ක් පමණ පැවත ඇති බවටත් එහි දී මෙම තැනැත්තියගේ ගර්භනීත්වය පිළිබඳව යම් අවධානමක් ඇති බවට වාර්ථා කර ඇත. එම කොටස වී. 5-1 ලෙස ලකුණු කර ඇත. තවද, 09.03 වෙනි දින ද රුධිර වහනයක්

15 MAY 2019
HIGH COURT KALUTARA

15 MAY 2019

පිළිබඳව එම වී.5 හි සඳහන් කර ඇති අතර එම කොටස වී.ත6 ලෙස විත්තිය විසින් ලකුණු කර ඇත. එහිදී වෛද්‍යවරයා විසින් 1 වන සාක්ෂිකාරියව නාරි සහ ප්‍රසව වෛද්‍යවරයාට යොමු කර ඇත. නමුත් මෙම යොමු කිරීම සම්බන්ධයෙන් 1 වන සාක්ෂිකාරියගෙන් හරස් ප්‍රශ්න අසා ඇති අතර ඇය කියා සිටියේ ඇයට එවැනි උපදෙසක් නොලැබුන බවත් ඇයට කාඩ්පතේ සඳහන් ඉංග්‍රීසි කියවීමට නොහැකි බවත්ය. වී.5 දරණ ලේඛණයේ වම් පැත්තේ රතුපාටින් ස්ටිකරයක් අලවා ඇති අතර එම ස්ටිකරයද මව අවදානම් තත්ත්වයක සිටින බවට සඳහන් කර ඇත. එම කොටස වී.5අ ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇත. මෙම වෛද්‍යවරයාගේ සාක්ෂි අනුව මෙම පෙර ප්‍රසව රුධිර වහනය ගබ්සාවීමකට වඩාත් ප්‍රවනතාවයක් ඇති බවටත් සාක්ෂි දී ඇත. මෙම වෛද්‍යවරයාගේ සාක්ෂිය විත්තිය විසින් කැඳවන ලද හෙද නිලධාරිනි පුංචිකුමාරිහාමි සහ පවුල් සෞඛ්‍ය සේවිකා වයලට් සෝමසිරි යන අයගේ සාක්ෂියෙන්ද සනාථ වී ඇත. ඒ අනුව මෙම 1 වන සාක්ෂිකාරියට සිදු වී ඇතයි කියන ගබ්සාව මෙම නඩුවේ 1 වන විත්තිකරු විසින් කරන ලදැයි කියන පහර දීමකින් සිදුවූවක්දැයි යන කරුණ පිළිබඳ සැකයක් මතු වේ.

මෙම නඩුවේ පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි දීම සඳහා කැඳවූ වෛද්‍ය සුනිල් කුමාර මහතා සාක්ෂි දෙමින් කියා සිටියේ ඔහු 2001.9 වෙනි මාසය වන විට කලුතර මහ රෝහලේ

HIGH COURT KALUTARA
15 MAY 2019



අධිකරණ වෛද්‍ය නිලධාරි ලෙස සේවය කල බවත් ඒ අවස්ථාවේ දී එම රෝහලට ඇතුලත් කල රෝගියෙක් සම්බන්ධයෙන් විශේෂ විමර්ශන අංශය මගින් ඔහුගෙන් ප්‍රකාශයක් ලබා ගත් බවත් එම ප්‍රකාශයට අදාල රෝගියා වන රංජනී රූපිකා නමැත්තිය ඔහු විසින් පරීක්ෂා කර බලා නොමැති නමුත් 2001.11.12 වෙනි දින ඔහුට ලැබුන දැන්වීමක් අනුව එම රෝගියා සම්බන්ධයෙන් ඇති වාර්ථා පිළිබඳව පරීක්ෂා කර බලන ලද අතර එම රෝගියාට 2001.09.23 වෙනි දින නාගොඩ රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබා දී ඇති බවට සාක්ෂි දී ඇත. එම රෝගියාට අදාල ටිකට් පතේ සඳහන් වී ඇත්තේ යෝනි මාර්ගයෙන් ලේ ගැලීමක් සම්බන්ධයෙන් ඇයට ප්‍රතිකාර ලබා දී ඇති අතර ඇයගේ ගර්භාෂයේ පිළිසිඳ ගැනීමක කොටස් තිබී ඇති අතර ඒ සම්බන්ධයෙන් ශෛල්‍යකර්මයක් කල යුතු බවට ප්‍රකාශ කර ඇති අතර එම වාර්ථාව අනුව එම රෝගියාට පහර දීමක් සම්බන්ධයෙන් කිසිවක් හෙලි වී නැති බවත් බවත් එවැනි පහර දීමක් 2001 වර්ෂයේ දී සිදු වුයේ නම් අනිවාර්යෙන්ම සාක්ෂිකරු එම රෝගියා පරීක්ෂා කර බලන බවත් ප්‍රකාශ කර ඇත. තවද, ඔහු විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්ථාව පැ.4 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇත. ඔහුගේ සාක්ෂියෙන් කියා ඇත්තේ සාමාන්‍යයෙන් පොත්පත් වල සඳහන් වන ආකාරයට

10% න් 15% ක් පමණ කාන්තාවන්ට ස්වභාවික ගබ්සාවන්ට ලක්වීමට ඉඩ ඇති බවත්ය. නමුත් ඔහු සාක්ෂි දෙමින් කියා ඇත්තේ කෙලින්ම ගැබිනියකගේ බඩට පහරක් එල්ල කල විට ගබ්සාවක් සිදුවිය හැකිය යන්න පැවසිය නොහැකි අතර සෑම විටම එසේ නොවන බවට ප්‍රකාශ කර ඇති අතර එසේ සිදුවන අවස්ථාද ඇති බවට ප්‍රකාශ කර ඇත.

මීලගට සලකා බැලිය යුතුව ඇත්තේ මෙම නඩුවේ විත්තිකරුට විරුද්ධව ඇති චෝදනාව "........... නීති විරෝධී මත්පැන් ලඟ තබා ගැනීම සම්බන්ධයෙන් සැකපිට අත්අඩංගුවට ගන්නා ලද හේවගේ රංජනී රූපිකා නමැත්තිය ඇය විසින් කරන ලදැයි සැක කරන ක්‍රියාවක් සම්බන්ධ තොරතුරු ලබා ගැනීම සඳහා ඇයට වදදුන් බැවින්........ " අදාල පනත යටතේ දඩුවම් ලැබිය යුතු වරදක් කල බවය.

මෙම නඩුවේ 1 වන සාක්ෂිකාරියට විරුද්ධව තිබී ඇති චෝදනාව වී ඇත්තේ නීති විරෝධී මත්පැන් ලඟ තබා ගැනීම පිළිබඳවය. මෙම නඩුවේ 1 වන සාක්ෂිකාරිය දී ඇති සාක්ෂිය පරීක්ෂා කර බැලීමේ දී පැහැදිලිවම පෙනී යන්නේ මෙම නඩුවේ විත්තිකරු ඇය පහර දෙන ලද්දේ ඇය විසින් සිදු කර ඇති වරදට අදාල තොරතුරු ලබා ගැනීම

HIGH COURT KALUTARA
15 MAY 2019

සම්බන්ධයෙන් නොවන බවත් ඇය විසින් කරන ලද අදාල වරද සම්බන්ධයෙන් පොලීසියට යාම 1 වන සාක්ෂිකාරිය විසින් ප්‍රතික්ෂේප කරන ලද හෙයින් බවයි.

මෙම නඩුවේ විත්තිකරු සාක්ෂි දී ඇති අතර විත්තිකරුගෙන් හරස් ප්‍රශ්න අසන අවස්ථාවේ දී රජයේ නීතිඥ මහතා විසින් අසන ලද හරස් ප්‍රශ්නවලට පිලිතුරු දෙන අවස්ථාවේ දී විත්තිකරු කියා ඇත්තේ මෙම නඩුවේ 1 වන සාක්ෂිකාරිය අදාල නීති විරෝධී මත්පැන් ලඟ තබා ගැනීමේ චෝදනාවට අත්අඩංගුවට ගැනීමෙන් අනතුරුව ඇය ගැබිණි කාන්තාවක් කියා කියන ලද හේතුව මත සානුකම්පිත හේතු මත ඇගේ පුරුෂයා ඉදිරිපත් වන්නේ නම් ඇය මුදා හැරිය හැකි බව පැවසූ බවයි. රජයේ අධි නීතිඥ මහතා කියා ඇත්තේ නීතිය අනුව එවැනි ක්‍රියාවක් කිරීමට විත්තිකරුට නොහැකි බවයි. විත්තිකරු ඒ සම්බන්ධයෙන් කියා ඇත්තේ එය නීති විරෝධී ක්‍රියාවක් බව දන්නා නමුත් විත්තිකාරියට විරුද්ධව ඇත්තේ සුලු චෝදනාවක් නිසාද, ඇය ගැබිණියකය යන කරුණ පිලිගෙනද එම යෝජනාව කල බවයි. නීත්‍යානුකූලව මෙම නඩුවේ විත්තිකරුට එවැනි ක්‍රියාදාමයක් අනුගමනය කිරීමට අවකාශ නැත. ඒ අනුව විත්තිකරුගේ එම ක්‍රියාව නීත්‍යානුකූල බවට අධිකරණයට පිලිගත නොහැක. මෙම නඩුවේ පැමිණිල්ල වෙනුවෙන් යෝජනා කලේ විත්තිකරු එදින පොලිස් ස්ථානයෙන් 1 වන සාක්ෂිකාරිය අත්අඩංගුවට ගැනීමට යන

අවස්ථාවේ දී කාන්තාවක් අත් අඩංගුවට ගන්නා බව දැන දැනම කාන්තා නිලධාරිනියක් ඔහු සමග රැගෙන ගොස් නොමැති බවත් එයද පොලිස් දෙපාර්තමේන්තුවේ රෙගුලාසි වලට පටහැනි ක්‍රියාවක් බවයි. එම කරුණ සම්බන්ධයෙන් විත්තිකරු පවසා ඇත්තේ මතුගම පොලිස් ස්ථානයට මෙම නඩුවේ 1 වන සාක්ෂිකාරියත් ඇගේ ස්වාමි පුරුෂයාත්, එකී ස්වාමිපුරුෂයාගේ සහෝදරයන් ඇතුලු පවුලේ ඥාතීන් එම අදාල ප්‍රදේශයේ නීති විරෝධී මත්පැන් ජාවාරම කරගෙන යන බවට පොලිස් ඔත්තුකරුවකු සහ පෙත්සම් මගින් දැනගෙන සිටි බවත්, මෙම වැටලීමට යන අවස්ථාවේ දී විත්තිකාරියව අත්අඩංගුවට ගැනීම සඳහා පමණක් නොගිය බවට ලද තොරතුරු අනුව අදාල පරීක්ෂණය සඳහා ගිය අවස්ථාවේ දී මෙම 1 වන සාක්ෂිකාරියත් ඉහත සඳහන් චෝදනාවට අත් අඩංගුවට ගත් බවයි. ඔහු වැඩිදුරටත් පවසා ඇත්තේ කොයිම අවස්ථාවකවත් මෙම 1 වන සාක්ෂිකාරිය පරීක්ෂාවට ලක් කර නොමැති බවත්ය.

මෙම 1 වන සාක්ෂිකාරියගේ සාක්ෂියේ දී මෙම විත්තිකරු ඔහු විසින් ඇයට පහර දීමක් සිදු කලේද, යන කරුණ හැර ඇයව අන් ආකාරයකින් පරීක්ෂාවට ලක් කල බවක් පවසා නැත. ඒ අනුව කාන්තා පොලිස් නිලධාරිනියක් රැගෙන නොයාම සම්බන්ධයෙන්

15 MAY 2019
HIGH COURT KALUTARA

විත්තිකරු විසින් කර ඇති ප්‍රකාශය අධිකරණයට පිලිගත හැක. විත්තියෙන් මෙම නඩුවේ 1 වන සාක්ෂිකාරිය සාක්ෂි දෙමින් ඔවුන් ඇය සහ ඇගේ ස්වාමි පුරුෂයා නීති විරෝධි මත්පැන් ව්‍යාපාරයේ යෙදී නොසිටින බවට මෙම අධිකරණයේ අසත්‍ය ප්‍රකාශයක් කර ඇති අතර පසුව ඇගෙන් හරස් ප්‍රශ්න අසන අවස්ථාවේ දී ඇයත්, ඇගේ පුරුෂයාත්, පුරුෂයාගේ ඥාතීන් ද නීති විරෝධී මත්පැන් ජාවාරම සම්බන්ධයෙන් මතුගම මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇති බවත් ඒ සම්බන්ධයෙන් දඩුවම් ලබා ඇති බවටත් හෙලි වී ඇත. ඒ අනුව ද, මෙම වැටලීම කල අවස්ථාවේ දී විත්තිකරු 1 වන සාක්ෂිකරු හෝ ඇගේ පවුලේ කවුරු අත් අඩංගුවට ගන්නට යන ලද්දේද පිළිබඳව නිශ්චිත වශයෙන් නිගමනයකට එළඹිය නොහැක. ඒ කෙසේ වෙතත් එම කරුණ මෙම නඩුවේ විත්තිකරුට විරුද්ධව ඇති චෝදනාව ඔප්පු කිරීමට ප්‍රමාණවත් නොවන බවට නිගමනය කරමි.

තවද, මෙම නඩුවේ පැමිණිල්ල වෙනුවෙන් කැඳවූ පොලිස් පරීක්ෂක පද්මසිරි මුණසිංහ යන අය සාක්ෂි දෙමින් කියා සිටියේ මානව හිමිකම් කොමිෂන් සභාව විසින් විශේෂ අපරාධ විමර්ශන අංශයට කල දැනුම් දීමක් අනුව මෙම නඩුවේ විමර්ශන කටයුතු කල බවත් ඒ අනුව මෙම නඩුවේ සාක්ෂි දුන් 1 සහ 2 සාක්ෂිකරුවන්ගේ සාක්ෂි, වෛද්‍යවරුන්ගේ සාක්ෂි, සහ විත්තිකරුගේ ප්‍රකාශ සටහන් කර ගත් බවටත් සාක්ෂි දී ඇති අතර එම

15 MAY 2019
HIGH COURT KALUTARA

පරීක්ෂණයේ දී විත්තිකරු විසින් 1 වන සාක්ෂිකාරියට පහර දීමක් සිදු කර ඇති බවට හෙලි වූ බව ප්‍රකාශ කර ඇත. නමුත් හරස් ප්‍රශ්නවලට පිලිතුරු දෙමින් ඔහු කියා සිටියේ 1 සහ 2 සාක්ෂිකරුවන්ගේ සාක්ෂි හැර වෙනත් වෛද්‍ය සාක්ෂි මගින් එවැනි පහර දීමක් සම්බන්ධයෙන් හෙලිවීමක් සිදු නොවු බවත් ඉහත සඳහන් සාක්ෂිකරුවන්ගේ සාක්ෂි වලට අමතරව වෙනත් ස්වාධීන සාක්ෂි කිසිවක් විත්තිකරුට එරෙහිව සොයා ගැනීමට අපොහොසත් වී ඇති බවත්ය. මෙම නඩුවේ 1 වන සාක්ෂිකාරියට පොලිස් ස්ථානයේ දී රුධිර වහනයක් සිදු වු බවට ඇය විසින් මතුගම පොලිසියේ මේට්‍රන්වරියට දන්වා සිටි බවට ප්‍රකාශ කර ඇතත් පැමිණිල්ල එම මේට්‍රන්වරිය සාක්ෂි දීම සඳහා අධිකරණයේ කැඳවා නැත. තවද, ඇය පවසන අන්දමට ඇයට විශාල වශයෙන් ලේ ගැලීමක් සිදු වුයේ නම් එම ලේ ඇය ඇඳ සිටි ඇඳුම් වල ලේ තැවරිය යුතුව ඇත. නමුත් මෙම නඩුවේ පැමිණිල්ල විසින් ඇය එම අවස්ථාවේ දී ඇඳ සිටි ඇඳුම් නඩු භාණ්ඩ වශයෙන් ඉදිරිපත් කිරීමක් සිදු කර නැති අතර මෙම නඩුවේ 1 වන සාක්ෂිකාරියව ප්‍රථම අවස්ථාවේ දී පරීක්ෂා කර බලන ලද වෛද්‍යවරියගේ සාක්ෂියේ දී ද 1 වන සාක්ෂිකාරිය පවසන අන්දමට ඇය පොලීසියේ සිට කෙලින්ම රෝහලට ගියා නම් ඇය ඇඳ සිටි ඇඳුම් වල ලේ තැවරී ඇති බවට නිරීක්ෂණය

15 MAY 2019
HIGH COURT KALUTARA



කල යුතුව ඇත. නමුත් ඇයගේ සාක්ෂියෙන් ඇය එවැනි ලේ තැවරීමක් දුටු බවට ප්‍රකාශ කර නැත.

මෙම නඩුවේ විත්තිකරුට විරුද්ධව ඇත්තේ ඉතා බරපතල චෝදනාවක් වන අතර විත්තිකරු යම් හෙයකින් චෝදනාවට වරදකරු බවට නිගමනය කරන්නේ නම් ඔහුට අවම වශයෙන් අවුරුදු 7 ක සිර දඬුවම් නියම කල යුතුව ඇත. ඒ අනුව මෙම නඩුවේ විත්තිකරුට විරුද්ධව ඇති සාක්ෂි ඉතා සුපරික්ෂාකාරීව පරීක්ෂා කර බැලිය යුතු අතර මෙම නඩුවේ 1 වන සාක්ෂිකාරිය විසින් ප්‍රථමයෙන් මානව හිමිකම් කොමිෂමට කරන ලද ප්‍රකාශයත් ඉන් අනතුරුව වසරකට පමණ පසු, විශේෂ අපරාධ විමර්ශන ඒකකයට කරන ලද ප්‍රකාශයත් මෙම නඩුවේ මෙම අධිකරණයේ දෙන ලද සාක්ෂිත් අතර ඇති පරස්පර විරෝධතා සලකා බැලිය යුතුව ඇත.

මෙම නඩුවේ පැමිණිල්ල වෙනුවෙන් ද විත්තිය වෙනුවෙන් ද ඉදිරිපත් කරන ලද සියලුම සාක්ෂි ඉතා සුපරික්ෂාකාරීව සලකා බැලීමේ දී පැමිණිල්ල විත්තිකරුට විරුද්ධව ඇති චෝදනා සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කර නොමැති බවට නිගමනය කරමි. තවද, කලින් සඳහන් කරන ලද පරිදි විත්තිකරුට විරුද්ධව ඇති චෝදනාවෙහි අන්තර්ගත කරුණු ඔප්පු කිරීමට ද පැමිණිල්ල අපොහොසත්ව ඇති බවටද නිගමනය කරමි.

ඒ අනුව මෙම නඩුවේ විත්තිකරුට විරුද්ධව ඇති චෝදනාවෙන් එනම්: වර්ෂ 2001 ක් වූ සැප්තැම්බර් 14 වෙනි දින හෝ ඊට ආසන්න දිනයකදී මෙම අධිකරණයේ අධිකරණ බල සීමාව තුල පිහිටි අගලවත්ත දී නීති විරෝධී මත්පැන් ලග තබා ගැනීමව සම්බන්ධයෙන් සැකපිට අත්අඩංගුවට ගන්නා ලද හේනගේ රංජනී රූපිකා නමැති අය විසින් කරන ලදැයි සැකකරන ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් තොරතුරක් ලබා ගැනීම සඳහා වද දුන් බැවින් 1994 අංක 22 දරණ වදදීම සහ අනෙකුත් කෲර අමානුෂික හෝ නින්දිත සැලකීමට හෝ දඬුවම්වලට එරෙහිව වූ පසුව සම්මත පනත වන 2 (4) වගන්තිය යටතේ වරදක් සිදු කිරීම යන චෝදනාවෙන් විත්තිකරු නිදොස් කර නිදහස් කරමි.

අත් කලේ:

_(එච්.ඩී.ජේ. පෙරේරා)

මහාධිකරණ විනිසුරු - කලුතර

2006.08.22

........................................................................................................................

ඉහතින් දැක්වෙන්නේ කළුතර මහාධිකරණයේ එච්.සී. 276/03 දරණ නඩුවේ 2006.08.22 දින දරණ තීන්දුවේ සත්‍ය පිටපතක් බව මෙයින් සහතික කරමි.

සැකසුවේ:

සැසඳුවේ:

රිසිට් අංකය: F/24 378668
2019.05.08

රෙජිස්ට්‍රාර්:

නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්
මහාධිකරණය
කළුතර

15 MAY 2019

නිවසට එන අවස්ථාවේ දී සවස 4 ට 4.15 ට පමණ ආපසු ඇය නිවසට එන අවස්ථාවේ දී සිවිල් ඇඳුමෙන් සැරසී සිටි පුද්ගලයින් පස් දෙනෙක් හය දෙනෙක් සිටි අතර ඊට අමතරව ඇය හඳුනන ඇගේ නිවස අසල පදිංචි නිහාල් විජේසිංහ නමැත්තා ද සිටි බවත් ඇය පවසා සිටි අතර ඇය ඇගේ දරුවා සමඟ එන අවස්ථාවේ දී නිහාල් විජේසිංහ යන අය ඇයව පෙන්වා "ඔය එන්නේ රත්නසිරිගේ බිරිඳ" බව එහි සිටි අනිත් පුද්ගලයින්ට පැවසූ බවත් එම අවස්ථාවේදී විත්තිකරු ඇය ඉදිරියට පැමිණ "කෝ උඹේ මිනිහා" කියා ඇසූ බවත්, ඉන් පසු" කසිප්පු කෝ" කියා ඇසූ බවත් ඒ අවස්ථාවේ දී, "අපි ළඟ කසිප්පු නැහැ. කසිප්පු පෙරන ඒවා ඇහුවා. මම නැහැ කිව්වා, කියා පැවසූ බවත්, එම අවස්ථාවේ දී මෙම විත්තිකරු ඇයට ඔහු අත තිබූ පොල්ලකින් පහර දීමට තැත් කල බවත් ඇය පවසා ඇත. මෙම අවස්ථාවේ දී ඇය " ගහන්න එපා ළමයෙක් හම්බ වෙන්න ඉන්නේ " කියා විත්තිකරුට පැවසූ නමුත් විත්තිකරු" තොට එකෙක් නෙවෙයි දෙන්නෙක් හම්බ වෙන්න හිටියත් මට ප්‍රශ්නයක් නැහැ" කියා ඔහු පැවසූ බවත් ඇය කියා ඇත. විත්තිකරු ඇගේ කොන්දට පහරවල් දෙකක් ගැසූ බවත් ඉන් අනතුරුව ඔහු සමඟ පැමිණි දෙදෙනෙකුට මේ ගෑණිව ගෙනිහින් කසිප්පු කෑන් එක රැගෙන එන ලෙසට දැන්වූ බවත්, පසුව එම

HIGH COURT
15 MAY 2019

දෙදෙනා සහ ඇය සමග නිවස ත0ලට ගොස් නිවසේ මේසය මත තිබුනු හිස් අරක්කු බෝතලයක් රැගෙන පැමිණි බවත් පසුව ඇය විත්තිකරුට ඇගේ දරුවා ව පුරුෂයාගේ මවට බාර දීමට අවශ්‍ය බව පැවසූ හෙයින් විත්තිකරු සහ පැමිණි පිරිස ඇයගේ පුරුෂයාගේ මවගේ නිවසට ඇය රැගෙන ගිය බවත් එම අවස්ථාවේ දී ඇයගේ මවට දරුවා බාර දුන් බවත් ඇය විත්තිකරුට පොලීසියට යාමට බැරි බව ප්‍රකාශ කල අවස්ථාවේ දී " යන්න බැරි මොකද " කියා පයින් පහරක් ඇගේ යටි බඩ පෙදෙසට ගැසූ බවට සාක්ෂි දී ඇත. තවද, එසේ පහර දීමෙන් අනතුරුව ඇයව " යමන් " කියා තල්ලු කරගෙන ගිය බවත් එම අවස්ථාවේ දී ඇය මුනින් අතට බිම වැටුණු බවත් සාක්ෂි දී ඇත. පසුව ඇයව තවත් සැකකරුවන් කීප දෙනෙකු අත්අඩංගුවට ගැනීමෙන් අනතුරුව පොලීසියට රැගෙන ගිය බවත් පොලීසියේ දී ඇයව මහලු කාන්තාවකට බාර දී ඇති අතර ඇයට ඒ අසල තිබුනු බංකුවක වාඩි වී සිටීමට කී බවත් පවසා ඇති අතර රාත්‍රී 9.30 ට පමණ ඇයට ලේ ගැලීමක් සිදු වූ බවත්, ඇය ඇයව බාරව සිටි පාලිකාවට ඒ බව පැවසූ නමුත් ඇය ඒ සම්බන්ධයෙන් කිසිම තැකීමක් නොකල බවත් කියා ඇති අතර ඇයට බඩේ සහ පිටකොන්දේ වේදනාව තදින් තිබුනු බව කියා ඇත. පසුදින උදේ පුරුෂයාගේ මව පොලීසියට පැමිණි විට

ඇයට ලේ ගැලීම පිළිබඳව දැනුම් දුන් අතර මව අසල කඩයට ගොස් ඇයට ඇඳ ගැනීමට සඳහා සනීපාරක්ෂක තුවා ගෙනැත් දුන් බවටත් ප්‍රකාශ කර ඇති අතර පසුව සවස දෙකට දෙකයි තිහට පමණ ඇයට පොලීසියෙන් ඇප දුන් පසු ඇය පිඹුර රෝහලට ගොස් ඇතුල් වූ අතර එදින සිට එනම් 15 වෙනි දින සිට 18 වෙනි දින තෙක් එම රෝහලේ ප්‍රතිකාර ලැබූ අතර ඉන් අනතුරුව නිවසට ගිය අතර ඇයට නැවත වරක් 2001.09.23 වෙනි දින නැවත ලේ ගැලීම තදින් පැවති බැවින් ඇය නැවත වරක් පිඹුර රෝහලට පැමිණි බවත් ඉන් පසු ඇයව පිඹුර රෝහලෙන් නාගොඩ රෝහලට මාරු කල අතර 2001.09.24 දින ඇයගේ දරුගැබ විනාශ වී ඇති බව කියා ගර්භාෂය සේදීමකට ලක් කල බවට සාක්ෂි දී ඇත. ඇය ඉන් අනතුරුව සැප්තැම්බර් 25 වෙනි දින රෝහලෙන් පිටව ගොස් පොලීසියට ප්‍රකාශයක් කල අතර ඉන් අනතුරුව මානව හිමිකම් කොමිසමට පැමිණිලි කල බවට සාක්ෂි දී ඇත. මෙම සාක්ෂිකාරිය ඉතා දීර්ඝ ලෙස හරස් ප්‍රශ්න වලට භාජනය කර ඇති අතර හරස් ප්‍රශ්න වලට පිලිතුරු දෙමින් ඇය කියා සිටියේ ඇගේ නිවසට කිසි දිනෙක පොලීසියෙන් පැමිණි නැති බවත්, සිද්ධිය වූ දින මුලින්ම " උඹේ මිනිහ කෝ " කියා ඇසූ බවත් එවිට ඇය ඔහු වැඩට ගිය බව පැවසූ බවත් ඉන් පසුව කසිප්පු නොමැති බව පැවසූ විට කසිප්පු

පෙරත උපකරණ ඉල්ලු බවත් ඇය ඒවාද නොමැති බවට ප්‍රකාශ කර සිටි බවත් හරස් ප්‍රශ්නවලට පිලිතුරු ලෙස ප්‍රකාශ කර ඇති අතර, ඇය පවසා ඇත්තේ ඇය නැත කියා කී අවස්ථාවේ දී ඇගේ කොන්දට පොල්ලකින් පහර දෙකක් ගැසූ බවය. ඇය සාක්ෂි දෙමින් කියා සිටියේ ඇගේ නිවසට ඇතුල් වීමට සහ පිටවීමට දොරවල් දෙකක් ඇති බවත් පිටවීමට ඇති දොරට අගුලක් නොමැති අතර එම දොර වසා ඇතුලෙන් පොල්ලක් දමා සිර කරන බවත් ඉදිරිපස දොර යතුරකින් වසන බවත්ය. ඇය හරස් ප්‍රශ්නවලට පිලිතුරු දෙන අවස්ථාවේ දී නිවසට ඇතුල් වන අවස්ථාවේ දී නිවසේ යමෙකු විසින් ඇතුල් වී අවුස්සා තිබුණු බවත් රාක්කය උඩ තිබුණු සිංහල අවුරුද්දට යාලුවන්ට දීමට ගෙනැත් තිබුනු අරක්කු බෝතලය කිසිවෙකු විසින් මැද මේසය මත තබා තිබුණු බවත්ය. ඇගේ මෙම ප්‍රකාශය සලකා බැලීමේ දී මෙම විත්තිකරු සහ ඔහු සමග පැමිණි අනිත් නිලධාරින් ඇගේ සාක්ෂියට අනුව ප්රථම වතාවට නිවස තුලට ගොස් ඇත්තේ ඇය සමගය. එසේ නම් නිවස ඇතුලත තිබුනු භාණ්ඩ අවුස්සා දමන ලද්දේ කවුරුන්ද යන්න පිළිබඳව ඇය පැහැදිලි කිරීමක් කරන්නේ නැත. විත්තිකරු සාක්ෂි දෙමින් කියා සිටියේ ඔහු මෙම වැටලීම සඳහා 1 වන සාක්ෂිකාරියගේ නිවසට ගිය අවස්ථාවේ දී නිවස පිටුපසින් දෙදෙනෙකු පැන යනවා දුටු බවත් ඔහු සමග ගිය නිලධාරින්ගෙන් එම පැන ගිය එක පුද්ගලයෙකු මෙම සාක්ෂිකාරියගේ

15 MAY 2019

පුරුෂයා වන රත්නසිරි නමැත්තා බවට දැන ගත් බවත්ය. විත්තිකරු පවසා සිටියේ පසුව, ඔහු සමග ගිය නිලධාරීන් දෙනෙකුට මෙම සාක්ෂිකාරිය සමග නිවසට ගොස් නීති විරෝධී මත් ද්‍රව්‍ය ඇත්දැයි පරීක්ෂා කර බලන ලෙස උපදෙස් දුන් බවත්, ඒ අනුව 1 වන සාක්ෂිකාරිය සමග නිලධාරින් දෙදෙනෙකු නිවසට ගොස් නිවසේ තිබූ නීති විරෝධී මත්පැන් වන කසිප්පු ඩ්‍රැම්ස් 16 ක් අඩංගු බෝතලයක් අත්අඩංගුවට ගත් බවත් එම අවස්ථාවේ දී ඇයට වරද කියා දී අත්අඩංගුවට ගත් බවත් කියා සිටියේය. එම අවස්ථාවේ දී ඇය දරුවෙකු ලැබීමට සිටින බව පැවසූ බවත් ඔහු විත්තිකාරියට විරුද්ධව ඇති චෝදනාව ඉතා සුළු චෝදනාවක් වන බැවින් ඇයගේ පුරුෂයා ඉදිරිපත් වුවහොත් ඇයව මුදා හැරීමට හැකි බව පැවසූ බවත් ඒ අනුව ඇගේ පුරුෂයා පැමිනේද යන්න බලාපොරොත්තුවෙන් එම ස්ථානයේ ටික වේලාවක් සිටි නමුත් ඔහු නොපැමිණි බැවින් සහ පසුව 1 වන සාක්ෂිකාරිය ඇගේ භාරයේ සිටි දරුවාගේ ඇගේ නැන්දම්මා ට බාරදීමට අවශ්‍ය බව පැවසූ හෙයින් ඇයව ඇගේ පුරුෂයාගේ මවගේ නිවසට රැගෙන ගොස් දරුවා නැන්දම්මා වන මෙම නඩුවේ 2 වන සාක්ෂිකාරිය වන ඩොල්පින් නෝනා යන අයට බාර දී 1 වන සාක්ෂිකාරිය රැගෙන පොලීසියට පැමිණි බව ප්‍රකාශ කර ඇත. මේ අනුව 1 වන සාක්ෂිකාරිගේ සාක්ෂියත්

15 MAY 2019
HIGH COURT

විත්තිකරුගේ සාක්ෂිත් සලකා බැලීමේ දී විත්තිකරුගේ ප්‍රකාශය අනුව ඔහු වැටලීම සඳහා නිවසට යන අවස්ථාවේ දී නිවස තුල සිට දෙදෙනෙකු පිටුපස දොරෙන් පැන ගියාය යන ප්‍රකාශය අධිකරණයට පිළිගත හැකිය. මන්ද, 1 වන සාක්ෂිකාරියගේ සාක්ෂි අනුව නිවසට පිටුපස දොරෙන් යමෙකු ඇතුල් වී කුස්සියේ රාක්කයේ තිබුනු බෝතලය මේසය උඩ තිබී පොලීසිය විසින් සොයා ගත්තා යන්න ඇගේ සාක්ෂියේ පිටුපස දොරේ පොල්ල ඉවත් කර දොර පලු හේත්තු කර තිබුනා යන ප්‍රකාශයෙන් සනාථ වී ඇත.

තවද, මෙම නඩුවේ 1 වන සාක්ෂිකාරිය සාක්ෂි දෙමින් කියා සිටියේ ඇයව අත් අඩංගුවට ගැනීමට පැමිණි නිලධාරින් සියලු දෙනාම සිවිල් ඇඳුමෙන් සැරසී සිටි බවය. නමුත් පැමිණිල්ල වෙනුවෙන් කැඳවූ 2 වන සාක්ෂිකාරිය වන ඩොල්පින් නෝනා නමැත්තිය ප්‍රකාශ කර ඇත්තේ පැමිණි අයගෙන් එක් අයෙකු පොලිස් නිල ඇඳුම් ඇඳ සිටි බවත් සෙසු අය සිවිල් ඇඳුමෙන් සැරසී සිටි බවත්ය.

මෙම 1 වන සාක්ෂිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාවට දෙන ලද ප්‍රකාශය විත්තිකරු විසින් වී.1 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇති අතර 1 වන සාක්ෂිකාරිය එම කොමිසමට දී ඇති ප්‍රකාශයේ සඳහන් කර ඇත්තේ ඇගේ නිවස අසල දී විත්තිකරු අඩි එකහමාරක් පමණ දිග පොල්ලකින් ඇයට පහර දුන් බවත් ඔහු ඇයගේ පිටට පහර දුන්

15 MAY 2019 HIGH COURT KALUTARA



බවත් ඉන් අනතුරුව එම අවස්ථාවේ දීම ඇයගේ බඩට පයින් පහරක් ගැසූ බවත්ය. මෙම පලවන සාක්ෂිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද පැමිණිල්ල අනුව කරන ලද පරීක්ෂණයේ වාර්ථාව පැමිණිල්ල විසින් පැ.1 ලෙස ඔප්පු කිරීමේ භාරයට යටත්ව ඉදිරිපත් කර ඇත. විත්තිය විසින් වි.1 ලෙස ඉදිරිපත් කරන ලද 1 වන සාක්ෂිකාරිය විසින් ඉහත කී මානව හිමිකම් කොමිෂන් සභාවට කරන ලද ප්‍රකාශයේ ඔප්පු කිරීමේ භාරයට යටත්ව ඉදිරිපත් කර ඇත. නමුත් ඉහත කී පැ.1 සහ වී.1 දරණ ලේඛණය ඔප්පු කිරීම පැමිණිල්ල සහ විත්තිය විසින් සිදු කර නොමැත. නමුත් මෙම නඩුව අවසානයේ දී පැ.1 සහ වී.1 දරණ ලේඛණ ඔප්පු කිරීමේ භාරයට යටත්ව ඉදිරිපත් කර ඇති බවත් නමුත් එම ලේඛණ ඔප්පු කර නැති බැවින් විත්තිය හෝ පැමිණිල්ල එම ලේඛන ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් විරෝධතාවයක් දක්වන බව ප්‍රකාශ කර නොමැත. ඒ අනුව එම ප්‍රකාශ ඔප්පු කරන ලද ප්‍රකාශ වශයෙන් බාර ගතිමි. මේ අනුව ඇගේ බඩට පහර දීම සම්බන්ධයෙන් ඇය විසින් පහර දුන්නේ කුමන ස්ථානයක්ද යන්න සම්බන්ධව පරස්පර විරෝධතාවයක් ඇති අතර ඇත්ත වශයෙන්ම අයට එසේ පහර දීමක් සිදු වුයේ නම් එම පහර දීම සිදුවු යේ ඇගේ නිවස ලඟදී ද, එසේ නැතහොත් පුරුෂයාගේ මවගේ නිවස අසල

දී ද, යන්න පිළිබඳව විශාල සැකයක් මතු වී ඇත. ඇය පවසා සිටියේ මෙම විත්තිකරු සහ අනෙකුත් පිරිස ඇගේ නිවස ඉදිරියට පැමිණ ප්‍රථමයෙන් " කෝ උඹේ මිනිහා "කියා ඇගේ ස්වාමියාව ඇසූ බවත්, එවිට ඇය ස්වාමියා වැඩට ගිය බව පැවසූ විට කොහේද ඉන්නේ කියා මට ගහන්න හැදුවා " යනුවෙන් ඇය මානව හිමිකම් කොමිෂන් සභාවට පවසා ඇති අතර හරස් ප්‍රශ්නවලදී ඇය කියා සිටියේ ඇය එවැනි ප්‍රකාශයක් නොකල බවයි. එම පරස්පර විරෝධතාවය විත්තිකරු විසින් වී.2 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇත. මෙම 1 වන සාක්ෂිකාරිය විසින් කොළඹ විශේෂ අපරාධ විමර්ශන ඒකකයට කරන ලද ප්‍රකාශයේ " කසිප්පු ගනින්" කියා මගේ පිට කොන්දට පහරවල් දෙකක් තුනක් අතේ තිබුන පොල්ලෙන් ගැහුවා යනුවෙන් පැවසුවා ද යන්න පිළිබඳව ප්‍රශ්න කල විට ඇය කියා සිටියේ ඇය එවැන්නක් නොකී බවයි. එම ප්‍රකාශය වී.3 ලෙසත්, එම ප්‍රකාශයේ පිට කොන්දට පහරවල් දෙකක් තුනක් ගැහුවා යන කොටස වී.4 ලෙසත් ලකුණු කර ඉදිරිපත් කර ඇත. මෙම 1 වන සාක්ෂිකාරිය විසින් හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින්, ඇය විසින් සහකාර පොලිස් අධිකාරී වෙත 2002.10.22 වෙනි දින කර ඇති ප්‍රකාශයේ පවසා ඇත්තේ නිවයස අසල දී කසිප්පු ගනින් කියා ඇගේ කොන්දට පොලු පහරවල් දෙකක් තුනක් ගැසූ බව කියා ඇති බවත්, පසුව පුතාව දෙන්න පුරුෂයාගේ අම්මගේ නිවසට ගිය විට ඇගේ මව ඉදිරියේ දී "

15 MAY 2019

මට පොලීසියට යන්න බැහැ, ළමයෙක් ලැබෙන්න ඉන්නවා" කියා කී විට " මොකද යන්න බැරි " කියා බඩට පයින් පහරක් ගැසූ බවත් එවිට ඇය බිම වැටුණු බවත් ප්‍රකාශ කර ඇති අතර එම අවස්ථාවේ දී පුරුෂයාගේ මව ද එම ස්ථානයේ සිටි බව ප්‍රකාශ කර ඇත. නමුත් මෙම නඩුවේ සාක්ෂි දුන් පුරුෂයාගේ මව වන ඩොල්පින් නෝනා යන අය මූලික සාක්ෂියේ කියා සිටියේ 1 වන සාක්ෂිකාරිය " මට පොලීසියට යන්න බැහැ කියා කී අවස්ථාවේ දී " උඹලව මරන්න නෙවෙයි ගෙනියන්නේ " කියා කී බවත් පයින් පහරක් ගැසූ බවත් එය වැදුනේ කොහේටද වැදුනේ යන්න දන්නේ නැති බවත් ප්‍රකාශ කර ඇති බවයි. නමුත් ඇය හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් කියා ඇත්තේ යන්න බැහැ කියා නැවෙන විට පයින් පහරක් ගැසූ බවත්ය. නමුත් මෙම දෙවන සාක්ෂිකාරිය වන ඩොල්පින් නෝනා යන අය විසින් විශේෂ අපරාධ විමර්ශන ඒකකයට කරන ලද ප්‍රකාශය වී.6 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇත. එහි දී ඇය පවසා ඇත්තේ විත්තිකරු 1 වෙනි සාක්ෂිකාරිය තල්ලු කල බවත් ඇය වැටුන බවත් නැගිටින්නට උත්සාහ කල අවස්ථාවේ දී ඉහත සඳහන් පරිදි පයින් පහරක් ගැසූ බවත්ය. නමුත් 1 වන සාක්ෂිකාරිය කුමන අවස්ථාවකවත් විත්තිකරු ඇයව තල්ලු කර වැටුන පසු ඇයගේ බවට පයින් ගැසූ බවක් පවසන්නේ නැත. මේ අනුව 1 වන සාක්ෂිකාරිය

15 MAY 2019

පවසන අන්දමට විත්තිකරු විසින් පයින් පහර ගැසුවේ නම් එම පහර වැදුනේ නම් එම පහර වැදුනේ කුමන ස්ථානයකටද යන්න සම්බන්ධයෙන් සැකයක් මතුවේ. මෙම 2 වන සාක්ෂිකරු වන ඩොල්පින් නෝනා යන අයගෙන් හරස් ප්‍රශ්න අසන අවස්ථාවේ දී එම හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙන මග හරිමින් ඇය පොලීසියට කරන ලද ප්‍රකාශය සම්බන්ධයෙන් ඇයට දැන් මතකයක් නැති බවට සාක්ෂි දී ඇත. මෙම ඩොල්පින් නෝනා යන අයගෙන් විත්තිය විසින් නිහාල් යන පුද්ගලයා සම්බන්ධයෙන් ප්‍රශ්න කර ඇති අතර ඇය දැඩි ලෙස කියා සිටියේ එවැනි පුද්ගලයෙකු ඇය නොහඳුනන බවය. නමුත් ඇය විසින් පොලීසියට කරන ලද ප්‍රකාශය ගෙනහැර දක්වමින් හරස් ප්‍රශ්න අසන අවස්ථාවේ දී එම නිහාල් යන අය හඳුනන බවට පිළිගෙන ඇත. ඊට අමතරව ඔහු සමග කථා බහ ද කර ඇති බවද පිළිගෙන ඇත. ඒ අනුව මෙම 2 වන සාක්ෂිකාරිය ද සිද්ධියට අදාල කරුණු වසන් කිරීමට උත්සාහ කරන බවට ඉතා පැහැදිලිවම පෙනී යයි. මෙහි දී තවත් වැදගත් කරුණක් වන්නේ 1 වන සාක්ෂිකාරිය පොලිස් ඇප මත මුදා හැරීමෙන් අනතුරුව පිඹුර රෝහලට ඇතුලත් වී ඇති අතර එම අවස්ථාවේ දී ඇයව පරීක්ෂා කර බලන ලද වෛද්‍යවරයාට ඇය පවසා ඇත්තේ පොලීසියෙන් ඇයට පහර දුන් බවයි. නමුත් ඇය ඇයට පහර දෙන ලද්දේ කවුරුන් විසින්ද යන්න පිළිබඳව ඇය වෛද්‍යවරයාට පවසා නැත. ඇය විසින් මෙම සිද්ධිය

15 MAY 2019 HIGH COURT KANDY



සම්බන්ධයෙන් මෙම විත්තිකරුගේ නම ප්‍රථම වතාවට සඳහන් කර ඇත්තේ ඇය විසින් මානව හිමිකම් කොමිෂමට දෙන ලද ප්‍රකාශයේදීය. වී.1 දරණ ඇයගේම ප්‍රකාශය පරීක්ෂා කර බැලීමේ දී පෙනී යන්නේ ඇය විසින් මානව හිමිකම් කොමිසමට දෙන ලද ප්‍රකාශයේ කොයිම අවස්ථාවකවත් ඇයගේ පුරුෂයාගේ මව ඉදිරියේ දී විත්තිකරු ඇයට පහර දුන් බව සඳහන් කර නොමැති බවය. ප්‍රථම වතාවට මෙම 1 වන සාක්ෂිකාරිය විසින් විත්තිකරු ඇයට පහර දෙන ලද්දේ ඇගේ පුරුෂයාගේ මව ඉදිරියේ දී බවට ප්‍රකාශ කර ඇත්තේ සිද්ධිය සිදු වී අවුරුද්දකට පමණ පසු අපරාධ විමර්ශන අංශයට කරන ප්‍රකාශයේ දීය. ඒ අනුව පෙනී යන්නේ මෙම විත්තිකරු විසින් ඇයට පහර දෙන ලදැයි කියන ප්‍රකාශය සනාථ කර ගැනීම සඳහා සාක්ෂියක් වශයෙන් පසුව මෙම නඩුවේ 2 වන සාක්ෂිකාරිය වන ඩොල්පින් නෝනා නමැත්තිය ඇදාගෙන ඇති බවය. ඇය විසින් මානව හිමිකම් කොමිසමට දෙන ලද ප්‍රකාශයේ ප්‍රථම වතාවට ඇගේ මව සහ නැන්දම්මා ඇය බැලීමට 15 වෙනි දින දහවල් 11 ට පොලිසියට පැමිණි බව ප්‍රකාශ කර ඇති අතර ඇය විසින් අපරාධ විමර්ශන අංශයට ප්‍රකාශ කර ඇත්තේ ළමයාව පුරුෂයාගේ අම්මාට බාර දීමට ගිය බවත්, පසුදින ඇගේ නැන්දම්මා පොලිසියට පැමිණි පසු ලේ ගැලීම සම්බන්ධයෙන් ඇයට දැන්වූ බවත්ය. මේ

අනුව ඇය විසින් මානව හිමිකම් කොමිෂමට කරන ලද ප්‍රකාශයත් අපරාධ විමර්ශන ඒකකයට කරන ප්‍රකාශයත් අතර පරස්පර විරෝධතා කිපයක් ඇති බවට සනාථ වේ. මෙම නඩුවේ හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් 1 වන සාක්ෂිකාරිය කියා ඇත්තේ ඇයව නිවසට රැගෙන ගිය නිලධාරින් දෙදෙනා ඇයට පොලීසියට යන්න කථා කල බවත් ඇය යාමට බැහැ කියා කී විට " ඉක්මනට ලැහැස්ති වෙන්න" කියා කී බවත් ඊට අමතරව කිසිවක් නොකල බවත් කියා ඇත. වැඩිදුරටත් හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් ඇය මෙසේ කියා ඇත.

ප්‍ර: තමාට යම් පහර දීමක් කලා නම් තමා කියන විදියට මේ විත්තිකරු විතරද,

උ: ඔව්.

ප්‍ර: වෙන මොකුත් කලාද මේ විත්තිකරු,

උ: මගදි දෙපාරක් තල්ලු කලා.

නමුත් ඇය විසින් මානව හිමිකම් කොමිෂන් සභාවට කරන ලද ප්‍රකාශයේ පවසා ඇත්තේ නිවස තුලට ගිය නිලධාරින් දෙදෙනා " නැවත වරක් ඒ දෙන්නා ගෙදර ඇවිස්සුවා. රාක්කයේ තිබුනු හිස් අරක්කු බෝතලයක් ගෙන මාව පාරට ගෙන ආවා. පාර ගෙන එන අතරතුර බැණ වදිමින් තල්ලු කලා. " වශයෙනි. එසේ පැවසූ බවට එම ප්‍රකාශය ඇය පිලිගෙන ඇති

15 MAY 2019
HIGH COURT



අතර, එම නිලධාරින් දෙන්නා 1 වන සාක්ෂිකාරියව තල්ලු කලාද යන ප්‍රශ්නයට දෙවන වතාවේ පිලිතුරු දී ඇත්තේ එම නිලධාරින් දෙන්නා සහ මේ විත්තිකරු යනුවෙනි. මේ අනුව ඇය මෙම නඩුවේ විත්තිකරු මෙම සිද්ධියට සම්බන්ධ කිරීමට දැඩි උත්සාහයක් දරණ බව පෙනී යන අතර විත්තියෙන් යෝජනා කර ඇත්තේ එම තල්ලු කිරීම සම්බන්ධයෙන් මෙම විත්තිකරු සම්බන්ධව එකම වචනයක්වත් කියා නැති බවය. එම යෝජනාවට 1 වන සාක්ෂිකාරිය කියා ඇත්තේ “ මම කියන්නේ ඇත්ත. පොලීසිය කැපුවා සේරම ”යනුවෙනි. තවද, මෙම මානව හිමිකම් කොමිෂන් සභාවට කරන ලද ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රශ්න කල අවස්ථාවේ දී ඇය කියා ඇත්තේ ඇගේ ප්‍රකාශය සටහන් කර ගන්නා අවස්ථාවේ දී අඩුපාඩු සිදුවුනාද යන්න ඇය නොදන්නා බවය. මෙම 1 වන සාක්ෂිකාරිය පවසන අන්දමට යම් පහරදීමක් සිදුවුයේ නම් එම පහර දීම සම්බන්ධයෙන් අධිකරණයට සැලකිල්ලට භාජනය කල හැකි එකම ස්වාධීන සාක්ෂිය වන්නේ මෙම පහරදීම සිදුවුවා කියන දිනට පසුදින ඇයව පරීක්ෂා කර බලන ලද වෛද්‍යවරයාගේ සාක්ෂියයි. ඇයව ප්‍රථම වතාවට පරීක්ෂා කර බලා ඇත්තේ පිඹුර රජයේ රෝහලේ වෛද්‍ය දනන්ගා නාමලී මහත්මියගේ සාක්ෂියයි. ඇයව විත්තිය වෙනුවෙන් සාක්ෂි දීම සඳහා කැඳවා ඇති අතර ඇය සාක්ෂි දෙමින් කියා සිටියේ 2001.09.15 දින ඇය පිඹුර රෝහලේ සේවය කල බවත් එදින ඇය රංජනී රූපිකා

HIGH COURT KALUTARA
15 MAY 2019



නමැත්තියට ඇතුලත් කර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කල බවටත් සාක්ෂි දී ඇති අතර ඊට අදාල ඇතුලත්වීමේ ලේඛණයේ මුල් පිටපත වී.8 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කර ඇත. එම වෛද්‍යාවරිය සාක්ෂි දෙමින් කියා සිටියේ එම රෝගී කාන්තාව රෝහලට ඇතුලත් කල අවස්ථාවේ දී රුධිර වහනයක් දක්නට ලැබුනු බවත් ඇය පරීක්ෂා කර බලන අවස්ථාවේ දී රෝගී කාන්තාවගේ මද රුධිර වහනයක් ඊට පෙර ද සිදු වී ඇති බව නිරීක්ෂණය කල බවත්ය. මෙම සාක්ෂිකාරියගේ උගත් රජයේ අධි නීතීඥ මහතා හරස් ප්‍රශ්න අසා ඇති අතර ඇය පවසා ඇත්තේ රෝගී කාන්තාව කෙටි ඉතිහාසයක් ලබා උවී ඇති බවත් එම කෙටි ඉතිහාසයේ දී ඇය එම දිනයේ රුධිර වහනයක් සිදුවෙමින් පැවති බවත් ඊට අමතරව පොලිස් නිලධාරින් පහර දීමක් කල පසු එම තත්ත්වය ඇති වු බවත් ප්‍රකාශ කල බවට සඳහන් කර ඇත. ඉන් පසුව ඇයව 18 වෙනි දින රෝහලෙන් මුදා හැර ඇති අතර ඇය නැවත වරක් 23 වෙනි දින රෝහලට ඇතුලත් කර ඇති බවනට ප්‍රකාශ කර ඇති අතර නැවත ප්‍රශ්නවලට පිලිතුරු දෙමින් ඇය කියා සිටියේ පහරදීමක් ගැන රෝගියා කියා සිටි බැවින් ඇය එම රෝගියා බාහිර වශයෙන් නිරීක්ෂණය කල අතර රෝගීන් පරීක්ෂා කරන